# තොප්පිගලින් ඔබ්බට

තොප්පිගල ජයග්‍රහණය පිළිබඳ ආරක්ෂක හමුදාවලට, පොලීසියට, ආරක්ෂක ලේකම්තුමාට හා අවශ්‍ය දේශපාලන නායකත්වය දුන් ජනාධිපතිතුමා ප්‍රධාන රජයට අපේ ප්‍රණාමය හිමිවෙයි. විශේෂයෙන් ම මේ සටන්වල දී දිවිදුන් රණවිරුවන් මෙහි දී අපේ සිහියට නැගෙයි. එසේ ම සටනේ දී දුවාල ලැබූ රණවිරුවෝ ද, අපේ ගෞරවයට පාත්‍ර වෙති. තොප්පිගල අවට භූමිය කොටි ත්‍රස්තවාදීන්ගේ ප්‍රධාන කඳවුරක් වූ බවට සැකයක් නැත. ඔවුන්ගේ පුහුණුවීම්වලට හා ත්‍රස්තවාදී ක්‍රියාවන්ට ප්‍රධාන වශයෙන් ම යොදාගැණුනේ මේ ප්‍රදේශය බව හමුදාව කියයි. මේ ප්‍රදේශය මුදාගැනීමට නොහැකි වූ ඉන්දීය ඊනියා සාම සාධක හමුදාවේ නිලධාරියකු පවසා ඇත්තේ ඉන්දියාව ඒ ප්‍රදේශය එතරම් වැදගත් ලෙස නො සැලකූ බව ය. ඒ තම අසාර්ථකත්වය වසා ගැනීමට කරන ප්‍රකාශයක් යැයි සිතමි. එහෙත් ඒ ඇත්තට ම කරන ප්‍රකාශයක් නම් පසුගිය අවුරුදු විස්සක පමණ කාලයක් මුළුල්ලේ කොටි මේ ප්‍රදේශය පදනම්කරගනිමින් කරන ලද සියළු ත්‍රස්තවාදී කටයුතු සම්බන්ධයෙන් ඉන්දියාව වගකිව යුතු ය. ඒ කෙසේ වෙතත් ඉන්දියාව හෝ වෙනත් රාජ්‍යයක් හෝ නොමැතිව කොටි පරාජයකිරීම ත්‍රිවිධ හමුදාවේ අභිමානයට හේතු වෙයි.

මේ අතර රනිල් වික්‍රමසිංහ මහතා විසින් කරන ලද ප්‍රකාශයක් අප සියළු දෙනාගේ ම සැලකිල්ලට භාජනය විය යුතු ය. ඔහුට අනුව හමුදාවල ජයග්‍රහණය ගැන උද්දාම වීමට තරම් දෙයක් නැත. තොප්පිගල ඇත්තේ කඳු හා වනාන්තර පමණ ය. වික්‍රමසිංහ මහතාගේ භූගෝලීය අර්ථකථනය ගැන අපි යමක් නො කියමු. එහෙත් යුදමය වශයෙන් ගත්කල, ඒ මහතා කලින් ගෝඨාභය රාජපක්ෂ මහතා ගෙදර යැවිය යුතු යැයි කළ ප්‍රකාශය මෙන් ම මේ ප්‍රකාශය ද හුදු දේශපාලන ප්‍රකාශ පමණකි. ඔහු රැස්වීම්වල දී තම අනුගාමිකයන්ගේ අත්පොළොසන් බලාපොරොත්තුවෙන් කරන මෙවැනි ප්‍රකාශවලින් හමුදාවල කාර්යය අවතක්සේරු කරයි. ඒ අතර රට මුළාකිරීමට උත්සාහ ගනියි. වගකීමක් සහිතව ක්‍රියාකාරන විරුද්ධ පක්ෂ නායකයෙක් මෙවැනි ප්‍රකාශ නොකරයි. දහතුන් වතාවක් පරාජයට පත්වී ඇති ඔහු ඉතා පැහැදිලිව උත්සාහ කරන්නේ කෙසේ හෝ බලයට පත්වීමට ය. බටහිරයන්ගේ සෘජු නියෝජිතයා වූ වික්‍රමසිංහ මහතා ට නැගෙනහිර පළාත ආපසු කොටින්ට ලබාදීමේ අවශ්‍යතාව වෙයි.

අද ආණ්ඩුවට ඇති ප්‍රධාන අභියෝගය රනිල් වික්‍රමසිංහ මහතා නො වෙයි. අවුරුදු ගණනාවකට පසු නැගෙනහිර පළාතෙන් මුළුමනින් ම කොටි පළවා හැරීමෙන් පසුව අද ආණ්ඩුව එක් පැත්තකින් ඒ පළාත සංවර්ධනය කිරීමේ අභියෝගයට මුහුණ දී ඇත. අනෙක් පැත්තෙන් උතුරු පළාතෙන් ද කොටි පළවා හැරීමේ අභියෝගය ආණ්ඩුවට වෙයි. නැගෙනහිර පළාත අභියෝගාත්මක පළාතක් වනුයේ එහි සිංහල, දෙමළ, මුස්ලිම් ජනයා සම සම ව මෙන් පදිංචි වී සිටීම නිසා ය. කොළඹ නගර සභා සීමාවෙහි ජන අනුපාතයට සමීප ජන අනුපාතයක් නැගෙනහිර පළාතෙහි වෙයි. අද අවශ්‍ය වන්නේ නැගෙනහිර පළාතට කඩිනම් සංවර්ධන වැඩ පිළිවෙළකි. ආණ්ඩුව ඒ සඳහා පියවර ගෙන තිබීම සතුටට කරුණකි. අද නැගෙනහිර පළාත යැයි හැඳින්වෙන ප්‍රදේශය එකල රුහුණු රටේ කොටසක් විය. සිංහල රජවරුන්ගේ පාලන සමයන්හි දී රුහුණ සංවර්ධනය කිසි විටෙකත් නොසලකා නොහරින ලදී. එහෙත් පෘතුගීසි, ලන්දේසි මෙන් ම ඉංගිරිසින් ද මුහුදුබඩ පළාත් පාලනය කරද්දී රුහුණ අමතක කෙරුණා පමණක් නොව ඇතැම් විට වුවමනාවෙන් ම ඔවුන් විසින් ඒ නොසළකා හරින ලදී. නැගෙනහිර පළාත පමණක් නොව හම්බන්තොට දිස්ත්‍රික්කය ද එසේ නොසළකා හරින ලද ප්‍රදේශ වෙයි. මාතර හා ගාල්ල දිස්ත්‍රික්කවල ද යටත්විජිතවාදීන්ගේ අවධානය යොමු වී තිබුණේ නගර කිහිපයකට පමණ ය. රුහුණ ගැන පමණක් නොව අනෙක් ප්‍රදේශ ගැන ද කිවහැක්කේ එවැනි ම වූ කතාවකි. මේ තත්වය වෙනස්කර රට සංවර්ධනය කිරීමේ දී නැගෙනහිර පළාත හා අඩුම තරමින් හම්බන්තොට දිස්ත්‍රික්කය එකට ගෙන සැලැස්මක් ඇතිකිරීම රටේ යහපතට හේතු වෙයි.

උතුරු පළාත සම්බන්ධයෙන් ආණ්ඩුව අනුගමනය කිරීමට බලාපොරොත්තුවන්නේ කිනම් ප්‍රතිපත්තියක් ද? මෙහි දී වඩාත්ම බලපාන සාධකය වනුයේ බටහිර රටවල් ය. අඩුම තරමින් එංගලන්තයට (බ්‍රිතානියට) උතුරු පළාතේ දී කොටින්ට විරුද්ධව කරන මෙහෙයුම් නැවැත්වීමේ අවශ්‍යතාව වෙයි. බටහිර රටවල්වලට කොටි ආරක්ෂා කිරීමේ වුවමනාව වෙයි. පසුගිය දා එංගලන්තයේ දී කොටි නායකයන් දෙදෙනකු අත් අඩංගුවට ගැනීම පිළිබඳ ව අප කලබල විය යුතු නො වෙයි. දැන් ඉතින් එංගලන්තය ලංකාවේ දී කොටි පරාජයකිරීමට ලංකාණ්ඩුවට සහාය දෙනු ඇතැයි යමකු සිතන්නේ නම් ඒ මුළාවකි. බටහිර රටවල් කොටි සම්බන්ධයෙන් දැඩි පියවර ගන්නේ ඒ රටවල මිස ලංකාවේ දී

© Prof. Nalin De Silva

නො වෙයි. ඔවුහු ලංකාවේ දී කොටි ආරක්ෂා කිරීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කරති. බටහිර දී ඔවුන් කොටින්ට විරුද්ධ ව ක්‍රියා කරන්නේ, කොටි සංවිධානය තහනම් කරන්නේ කොටි හා අල් ක්වයිදා සංවිධානය අතර සම්බන්ධකම් ක්‍රමයෙන් හෙළිවීම හේතුවෙනි. බටහිර දී කොටි බටහිර රටවල පැවැත්මට තර්ජනයකි. එබැවින් එහි දී ඇතැම් විට කොටින්ට විරුද්ධව බටහිර රටවල් ක්‍රියාකරනු දැකිය හැකි ය. එහෙත් ලංකාවේ දී කොටි තර්ජනයක් වනුයේ සිංහලයන්ට හා සිංහල බෞද්ධ සංස්කෘතියට ය. බටහිරයෝ ද සිංහලයන්ට හා සිංහල බෞද්ධ සංස්කෘතියට විරුද්ධ වෙති. එබැවින් ලංකාවේ දී බටහිර රටවල් කොටි ආරක්ෂාකිරීමට කටයුතු කරනු ඇත. එපමණක් නොව එංගලන්තයේ දී පවා කොටි ලංකාවට විරුද්ධව ක්‍රියාකරන අවස්ථාවල එයට බාධා නො පැමිණෙයි. කොටින් ට ජුලි දහහතරවැනි දා ලංඩනයේ ට්‍රැෆල්ගාර් චතුරස්‍රයේ දී රැළියක් පැවැත්වීමට ලංඩන් නගරාධිපතිතුමාගෙන් අවසර ලැබී ඇත. නිල වශයෙන් එංගලන්තයේ තහනම් සංවිධානයක් වූ කොටින්ට ලංකාවට විරුද්ධව රැළි පැවැත්වීමේ තහනමක් නැත.

බටහිරයන්ට අවශ්‍ය ලංකාව කොටි සමග සාකච්ඡාකර අවසානයේ දී සන්ධීය හෝ සහසන්ධීය හෝ රාජ්‍යයක් කොටින්ට ලබාදීමට ය. සර්ව පාක්ෂික සම්මේලනය යම් යෝජනාවලියක් සම්මත කරගතහොත් ඒ කොටින්ට ඉදිරිපත්කිරීමට ආණ්ඩුවට බල කෙරෙයි. එවිට කොටි එතැනින් පටන්ගෙන බටහිරයන්ගේ ආධාරය ද ඇතිව සන්ධීය හෝ සහසන්ධීය රාජ්‍යයක් කරා යැමට උත්සාහ දරණු ඇත. එසේ වුවහොත් ඒ සර්ව පාක්ෂික සම්මේලනයේ යෝජනා අපතේ යැවීමක් වනු ඇත. කොටි සමග මින්පසු කිසිම සාකච්ඡාවක් අවශ්‍ය නො වේ. බටහිරයන්ගේ ආධාර ඇතිව වුව ද කොටින්ට ජයග්‍රහණය නොකළ හැකි බව නැගෙනහිර දී පෙන්වා දෙනු ලැබ ඇත. අනභිබවනීය බවට බටහිරයන්ගෙන් සහතික ලැබූ කොටි තොප්පිගල දී කැණහිලුන් සේ දිවූහ. අද කළ යුත්තේ කොටි සමග සාකච්ඡා පැවැත්වීම නොව උතුරු පළාතෙන් ද කොටි පරාජය කර පළවා හැරීම ය. සර්ව පාක්ෂික සම්මේලනයේ යෝජනාවක් වෙතොත් ඒ ඉදිරිපත් කළ යුත්තේ කොටින්ට නොව ජනතාවට ය. ජනමත විචාරණයකින ආණ්ඩුවට ඒ ජනතාවට යොමු කළ හැකි ය.

සර්ව පාක්ෂික සමුළුවෙන් ඒකමතික යෝජනාවලියක් ඉදිරිපත් නොවන්නේ නම් ආණ්ඩුව තම යෝජනා ජනමතවිචාරණයකට ලක්කළ යුතු ය. අද පවත්නා තත්වය අනුව එ ජා පක්ෂය සර්ව පාක්ෂික සම්මේලනයෙන් හා සර්ව පාක්ෂික නියෝජිත කමිටුවෙන් ඉවත්වීමට ඇති ඉඩකඩ බොහෝ ය. එවිට බටහිරයන් සර්ව පාක්ෂික සම්මේලනයේ යෝජනා පිළිගනී යැයි සිතිය නො හැකි ය. ආණ්ඩුවට උතුරු පළාතේ ද කොටින්ට විරුද්ධව හමුදා මෙහෙයුම් සිදු කෙරීමට වැඩි කලක් බලා සිටීමට අවශ්‍ය නොවනු ඇත. එහෙත් එසේ වුවහොත් බටහිරයන් ලංකාවට එක්සත් ජාතීන්ගේ හමුදා එවීමටත් ආර්ථික සම්බාධක පැණවීමටත් කටයුතු කරනු ඇත. චීනයේ මැදිහත්වීමෙන් එක්සත් ජාතීන්ගේ හමුදා එවීම වැළැක්වුණ ද, ආර්ථික තහංචි පැනවීම කිසිවිටෙකත් වැළැක්විය හැකි නො වෙයි.

එසේ නම් උතුරු පළාතෙන් කොටි පරාජය කිරීමට පියවර ගැනීමට හැකිවනු ඇත්තේ බටහිරයන්ගේ තහංචි මැද ය. ඒ නොකළ හැක්කක් නො වෙයි. ආරක්ෂක හමුදා ඒ සඳහා සූදානම් බව පැහැදිලි ය. එහෙත් ජනතාව ඒ සඳහා සූදානම් ද? ජනතාව ඒ සඳහා සූදානම්කිරීමට ආණ්ඩුව කළ යුත්තේ කුමක් ද? එහි දී ජනතාවට තාවකාලික ව යම් පරිත්‍යාග කිරීමට සිදුවනු ඇත. එවැනි අවස්ථාවක දී රනිල් වික්‍රමසිංහ මහතා හා එ ජා පක්ෂය කළ දූටුකල වළ ඉහගැනීමට ඉදිරිපත්වනු ඇත. රනිල් වික්‍රමසිංහ මහතාට අවශ්‍ය බටහිරයන් කියන දේ කිරීම බැවින් එ ජා පක්ෂය කොටින්ට වාසිවනු අයුරින් රටේ කලබල ඇතිකිරීමට පියවර ගනු ඇත.

ආණ්ඩුව එවැනි තත්වයකට මුහුණ දීමට සූදානම් විය යුතු ය. ආණ්ඩුව කොටි සමග සාකච්ඡා කලා හොඳට ම ප්‍රමාණවත් ය. ඊනියා සටන් විරාම ගිවිසුම හෙවත් රනිල් ප්‍රභාකරන් ගිවිසුම තවදුරටත් වලංගු නො වෙයි. ඒ වලංගු යැයි කියන්නකුට නැගෙනහිර පළාත ආපසු කොටින්ට දීමට සිදුවනු ඇත. එහෙත් මෙයින් කියන්නේ මේ රටට නව ව්‍යවස්ථාවක් අවශ්‍ය නොවන බව නො වෙයි. සර්ව පාක්ෂික නියෝජිත කමිටුවේත් සර්ව පාක්ෂික සම්මේලනයේත් කාර්යය වනුයේ එවැනි නව ව්‍යවස්ථාවක් සඳහා මූලික ප්‍රතිපත්ති කිහිපයක් සකස් කිරීම ය. ඒ පැන යන කොටි සඳහා නොව ජනතාව සඳහා ය. පැන යන කොටි හමුවේ සම්පාදිත ව්‍යවස්ථා එළීම අනුමත කළ හැකි නො වේ.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva